wsws.org

World Socialist Web Site

Published by the International Committee of the Fourth International

# සමාජවාදී කම්කරු පක්ෂයේ විවෘත ලිපිය

නොවැම්බර් 16, 1953

**මෙහි පහත පල වන්නේ 1953 නොවැම්බර් 16 ද එවකට එක්සත් ජනපදයේ ට්‍රොට්ස්කිවාදී පක්ෂය වන සමාජවාදී කම්කරු පක්ෂයේ නායක ජේම්ස් පී. කැනන් විසින් ලෝක ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය වෙත විවෘත ලිපියක් යන මැයෙන් ඉදිරිපත් කල ලිපියයි. එම නොවැම්බරයේ දී හතර වන ජාත්‍යන්තරය තුල හටගත් භේදයට තුඩු දුන් දේශපාලනික හා න්‍යායික ගැටලු කැනන්ගේ ලිපිය මගින් පැහැදිලි කෙරේ. එක්සත් ජනපදයේ ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ ආරම්භකයා වූ කැනන් විසින් නායකත්වය දුන් සම්මතධාරී ට්‍රොට්ස්කිවාදීන් ද එවක හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර ලේකම් මන්ඩලයේ ප්‍රධාන නායකයන් වූ මයිකල් පැබ්ලෝ හා අර්නස්ට් මැන්ඩෙල් විසින් මෙහෙයවන ලද අවස්ථාවාදී ප්‍රවනතාවන් ද අතර ඇති වූ මෙම භේදයේ දී පරදුවට තැබුනේ හතර වන ජාත්‍යන්තරයේ සමස්ත පැවැත්ම ම ය. කැනන්ගේ විවෘත ලිපිය නිකුත් කිරීමෙන් සතියකට පසු 1953 නොවැම්බර් 23 ද හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව පිහිටුවීම මගින් මයිකල් පැබ්ලෝගේ හා මැන්ඩෙල්ගේ අවස්ථාවාදී පිලිවෙතට එරෙහිව හතර වන ජාත්‍යන්තරයේ විප්ලවවාදී පිලිවෙත ආරක්ෂා කර ගැනුනි.**

එක්සත් ජනපදයෙහි ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයට පදනම දැමීමෙන් විසි පස් වන සංවත්සරයෙහි දී සමාජවාදී කම්කරු පක්ෂයේ ජාතික කමිටුවේ සම්මේලනය, ලොවපුරා සිටින සම්ප්‍රදායික ට්‍රොට්ස්කිවාදීන්ට තමන්ගේ විප්ලවවාදී සමාජවාදී සුබ පැතුම් එවයි.

සමාජවාදී කම්කරු පක්ෂය, ඩෙමොක්‍රට්වරුන් හා රිපබ්ලිකානුවරුන් විසින් සම්මත කෙරුනු ප්‍රජාතන්ත්‍ර විරෝධී නීතිරීති කරන කොට ගෙන, හතර වන ජාත්‍යන්තරයට — එනම්, සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ දෙවන ජාත්‍යන්තරය විසින් හා ස්ටැලින්වාදීන්ගේ තෙවන ජාත්‍යන්තරය විසින් පාවා දෙනු ලැබුනු ක්‍රියා මාර්ගය පෙරට ගෙන යාමට හා සපුරාලීමට ලියොන් ට්‍රොට්ස්කි විසින් පදනම දැමුනු, සමාජවාදී විප්ලවයේ ලෝක පක්ෂයට — තව දුරටත් සම්බන්ධිත නො වුවත්, සාපරාධී ලෙස මරා දමනු ලැබුනු අපගේ නායකයාගේ මග පෙන්වීම යටතේ නිර්මානය කෙරුනු ලෝක පරිමාන සංවිධානයේ ශුභ සිද්ධිය පිලිබඳ ව අපි උද්යෝගිමත් වන්නෙමු.

විසි පස් වසරකට පෙර, පුරෝගාමී ඇමරිකානු ට්‍රොට්ස්කිවාදීන්, ක්‍රෙම්ලිනය විසින් යට ගසන ලද ට්‍රොට්ස්කිගේ ක්‍රියා මාර්ගය, ලෝක මහ ජන මතයේ අවධානයට පාත්‍ර කල බව සුප්‍රකට කරුනකි. මෙම ක්‍රියාව ස්ටැලින්වාදී නිලධරය විසින් ට්‍රොට්ස්කි මත පැටවුනු හුදකලාව බිඳීමෙහි දී හා හතර වන ජාත්‍යන්තරයට පදනම දැමීමෙහි දී තීරනාත්මක විය. ඉන් කෙටි කලකට පසු ව තමන් පිටුවහල් කරනු ලැබීමත් සමග, ට්‍රොට්ස්කි, සමාජවාදී කම්කරු පක්ෂයේ නායකත්වය සමග තමන්ගේ මරනය සිදු වූ දිනය දක්වා ම පැවතුනු සමීපස්ථ හා විශ්වාසවන්ත සහයෝගිතාවකට මුල පිරුවේ ය.

රටවල් කිහිපයක විප්ලවීය සමාජවාදී පක්ෂ සංවිධානය කිරීමේ ඒකාබද්ධ ප්‍රයත්න මෙම සහයෝගිතාවෙහි අන්තර්ගත විය. ඔබ දන්නා පරිදි, 1938 හි හතරවන ජාත්‍යන්තරය දියත් කිරීමෙන් මෙම සහයෝගිතාව කුලුගැන්වින. අද දවසෙහි ලෝක ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ මුල්ගල ලෙස පවතින සංක්‍රමන ක්‍රියා මාර්ගය, සමාජවාදී කම්කරු පක්ෂයේ නායකයන් හා සහයෝගිත්වයෙන් ට්‍රොට්ස්කි විසින් රචනා කරනු ලැබින. ට්‍රොට්ස්කිගේ ම ඉල්ලීම පරිදි, ඔවුන් විසින්, මෙම ක්‍රියා මාර්ගය පාදක සම්මේලනයෙහි දී පිලිගැනුම සඳහා ඉදිරිපත් කරනු ලැබින.

ට්‍රොට්ස්කි හා සමාජවාදී කම්කරු පක්ෂයේ නායකත්වය අතර සහයෝගිතාවෙහි සමීපස්ථ භාවය හා පූර්නත්වය, බර්න්හැම් හා ෂැට්මන් විසින් නායකත්වය දෙනු ලැබුනු සුලු ධනේශ්වර විරුද්ධ පක්ෂයට එරෙහි ව සම්මත ට්‍රොට්ස්කිවාදී මූල ධර්ම ආරක්ෂා කිරීම සඳහා, 1939 සිට 40 දක්වා දියත් කෙරුනු අරගලයේ වාර්තාවෙන් නිශ්චය කර ගත හැකි ය. පසු ගිය 13 වසර තුල හතර වන ජාත්‍යන්තරය හැඩගැස්වීමෙහි ලා එම වාර්තාව ගැඹුරු බලපෑමක් කලේ ය.

ස්ටැලින්ගේ රහස් පොලිසියේ ඒජන්තයකු විසින් ට්‍රොට්ස්කි ඝාතනය කරනු ලැබීමෙන් අනතුරුව, ට්‍රොට්ස්කිගේ ඉගැන්වීම් ආරක්ෂා කිරීමේ හා ප්‍රචාරය කිරීමේ නායකත්වය සමාජවාදී කම්කරු පක්ෂය තමන් අතට ගත්තේ ය. අප නායකත්වය ගත්තේ කැමැත්ත හේතු කොට ගෙන නො ව අවශ්‍යතාව නිසා ය. දෙවන ලෝක යුද්ධය, බොහෝ රටවල, විශේෂයෙන් ම නාසීන් යටතේ යුරෝපයෙහි, සම්ප්‍රදායික ට්‍රොට්ස්කිවාදීන්ට රහසි ගත ව කටයුතු කිරීමට බල කලේ ය. දුෂ්කර යුද්ධ වර්ෂ මුලුල්ලේ අපි, ලතින් ඇමරිකාවෙහි, කැනඩාවෙහි, එංගලන්තයෙහි, ලංකාවෙහි, ඉන්දියාවෙහි, ඕස්ට්‍රේලියාවෙහි හා වෙනත් තැන්වල ට්‍රොට්ස්කිවාදීන් සමග සම්ප්‍රදායික ට්‍රොට්ස්කිවාදයේ ධජය ඔසවා තැබුමට අපිට හැකි දේ කලෙමු.

හතර වන ජාත්‍යන්තරය සංවිධානාත්මක ව යලි ව්‍යවස්ථා ගත කිරීමට උර දුන් ට්‍රොට්ස්කිවාදීන්, යුද්ධය අවසන් වීමත් සමග ම, යුරෝපය තුල රහසි ගත ව කටයුතු කිරීමේ තත්වයෙන් ඉස්මත්තට එනු දුටු අපි ඉමහත් සතුටට පත් වීමු. ප්‍රතිගාමී නීති මගින් හතර වන ජාත්‍යන්තරයට සම්බන්ධ වීමෙන් අප වලක්වනු ලැබුනු හෙයින්, අප ලෝක

ව්‍යාපාරයට ට්‍රොට්ස්කි විසින් දායාද කෙරුනු මහා සම්ප්‍රදාය දිගට ම පවත්වා ගෙන යාමෙහි සමත් නායකත්වයක ඉස්මතු වීම කෙරෙහි අපි වඩාත් ම අපේක්ෂා රැඳවීමු. යුරෝපය තුල හතර වන ජාත්‍යන්තරයේ තරුන අලුත් නායකත්වයට පූර්න විශ්වාසය හා සහයෝගය පුද කල යුතු යැයි අපි සිතුවෙමු. සහෝදරවරුන් තමන් ම ගත් නායකත්වයෙන් බැරෑරුම් වැරදි පිලිබඳ ස්වයං-නිරවද්‍ය වීම් ඇති කර ගැනෙන විට අප ගත් මාවත යුක්ති සහගත කෙරෙන බව අපට හැඟී ගියේ ය.

කෙසේ වෙතත්, අප, අනෙක් අයත් කැටුව, මෙම නායකත්වයට, තියුනු විවේචන නො කිරීමෙන් ලබා දුන් නිදහස ම ට්‍රොට්ස්කිවාදයේ ප්‍රාථමික ක්‍රියා මාර්ගය අත්හල පරිපාලනයෙන් හොර, රහසි ගත, පුද්ගලික කන්ඩායමකට හතර වන ජාත්‍යන්තරයේ පරිපාලනය පිලිබඳ ක්ෂේත්‍රයෙහි තහවුරු වීමට දොර විවර කිරීමට ආධාරක වූ වග අප දැන් පිලිගත යුතු ය.

පැබ්ලෝ වටා සංකේන්ද්‍රනය වූ මෙම කන්ඩායම දැන් දැනුවත් ව සිතාමතා ම ක්‍රියා කරනුයේ, විවිධ රටවල පවතින, ට්‍රොට්ස්කිවාදයේ ඓතිහාසික ව නිර්මිත කේඩරයන් කඩාකප්පල් කොට, භේද භින්න කොට විසුරුවා හැර, හතර වන ජාත්‍යන්තරය දිය කර හැරීමට ය.

## ට්‍රොට්ස්කිවාදයේ ක්‍රියා මාර්ගය

මෙහි දී අභියෝගයට ලක් ව ඇත්තේ කුමක් දැයි නිශ්චිත ව ගෙන හැර දක්වනු වස්, ලෝක ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය ගොඩනැංවීමට පදනම වූ මූල ධර්ම යලි ප්‍රකාශ කරමු.

1. ධනේශ්වර ක්‍රමයේ මර ලතෝනිය, එන්ට එන්ට ම දරුනු වන අවපාත, ලෝක යුද්ධ හා ෆැසිස්ට්වාදය බඳු ම්ලේච්ඡ ප්‍රපංච මගින් ශිෂ්ටාචාරය විනාශ වී යාමේ තර්ජනය ඉස්මතු කරයි. අද දින න්‍යෂ්ටික ආයුධවල වර්ධනය හැකි බැරෑරුම් ම ආකාරයට මෙම අනතුර අවධාරනය කරයි.

2. අගාධයට කිඳා බැසීම වැලැක්විය හැකි වනුයේ සමාජවාදයේ සැලසුම් ගත ආර්ථිකයෙන් ධනේශ්වර ක්‍රමය ලෝක පරිමාන ව විස්ථාපනය කිරීමෙන් හා ධනේශ්වර ක්‍රමය විසින් එහි මුල් දිනවල ආරම්භ කෙරුනු ප්‍රගතියේ සර්පිලාකාර ගමන යලි පටන් ගැනීමෙනි.

3. සමාජයෙහි මෙය සාක්ෂාත් කර ගත හැකි වනුයේ කම්කරු පන්ති නායකත්වය යටතේ පමනි. කම්කරුවන්ට බලයේ මාවත ගැනුම සඳහා, අද තරම්, අන් කිසි දාක සමාජ බලවේගවල ලෝක සම්බන්ධතාව යහපත් නො වුවත්, කම්කරු පන්තිය ම නායකත්වය පිලිබඳ අර්බුදයකට මුහුන දෙයි.

4. මෙම ලෝක ඓතිහාසික අරමුන සපුරා ගනු වස් තමන් සංවිධාන වනු පිනිස, සෑම රටක ම කම්කරු පන්තිය, ලෙනින් විසින් වර්ධනය කෙරුනු ආකාරයේ විප්ලවීය සමාජවාදී පක්ෂයක් ගොඩනැංවිය යුතු ය: එනම්, ප්‍රජාතන්ත්‍රවාදය හා මධ්‍යගත භාවය අපෝහකාත්මක ව සංයෝජනය කිරීමෙහි සමත් වන සටන් පක්ෂයකි - තීන්දුවලට එලඹීමෙහි ප්‍රජාතන්ත්‍රවාදයත්, ඒවා ක්‍රියාත්මක කිරීමෙහි මධ්‍යගත භාවයත්. අනුගාමිකත්වය විසින් පරිපාලනය කෙරෙන නායකත්වයක්, වෙඩි සැර හමුවෙහි ද විනය ගත ආකාරයට පෙරට යාමෙහි සමත් අනුගාමිකත්වයක්.

5. මෙයට පවත්නා ප්‍රධාන බාධකය ස්ටැලින්වාදය යි. රුසියාවේ 1917 ඔක්තෝබර් විප්ලවයෙහි හොඳ නම ගසා කමින් එය කම්කරුවන් ආකර්ෂනය කර ගන්නේ, හුදෙක් පසු ව, කම්කරුවන්ගේ විශ්වාසය පාවා දෙමින් ඔවුන් එක්කෝ සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ තුරුල්ලට, උදාසීනත්වයට ඇද දැමීමට හෝ ආපසු ධනේශ්වර ක්‍රමය පිලිබඳ ව ම මිථ්‍යාවන්ට ඇද හෙලීමට ය. ෆැසිස්ට් හෝ රාජාන්ඩුවාදී බල වේගයන්හි තහවුරු වීමේ රූපාකාරයෙන් හා ධනේශ්වර ක්‍රමය විසින් පෝෂනය කොට සූදානම් කෙරෙන අලුත් යුද පිපුරුම්වල රූපාකාරයෙන් කම්කරු පන්තිය මෙම පාවා දීම්වලට වන්දි ගෙවයි. හතර වන ජාත්‍යන්තරය එය පිලිසිඳ ගත් තැන් පටන් ම, තමන්ගේ ප්‍රධාන කර්තව්‍යයන්ගෙන් එකක් බවට පත් කර ගත්තේ එක්සත් සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමය තුලත් ඉන් බැහැරත් ස්ටැලින්වාදය විප්ලවීය අයුරින් පෙරලා දැමීම යි.

6. හතර වන ජාත්‍යන්තරයේ බොහෝ කන්ඩායම් ද එහි ක්‍රියා මාර්ගයට හිත පක්ෂපාතී පක්ෂ හෝ කන්ඩායම් ද හමුවෙහි නම්‍ය උපායන් සඳහා පවතින අවශ්‍යතාව විසින්, ස්ටැලින්වාදයට යටත් නො වී අධිරාජ්‍යවාදයටත් (ජාතිකවාදී සංයුතීන් හෝ වෘත්තීය සමිති නිලධරයන් බඳු) එහි සියලු ම සුලු ධනපති ආයතනවලටත් විරුද්ධ ව සටන් කල යුත්තේ කෙසේ දැ යි ඔවුන් විසින් දැන ගනු ලැබීම වඩාත් ම අනිවාර්ය භාවයට පත් කෙරේ. (අවසාන විග්‍රහයේ දී ස්ටැලින්වාදය වනාහි අධිරාජ්‍යවාදයේ ම සුලු ධනපති ආයතනයක් වෙයි.)

ලියොන් ට්‍රොට්ස්කි විසින් තහවුරු කෙරුනු මෙම මූලික මූලධර්ම වර්තමාන ලෝකයෙහි එන්ට එන්ට ම වඩවඩා සංකීර්න හා උච ශීලී වන දේශපාලනය තුල පූර්න වලංගු භාවය රඳවා ගෙන සිටී. සත්තකින් ම ට්‍රොට්ස්කි විසින් පෙර දකිනු ලැබුනු පරිදි, සෑම අතින් ම ව්‍යාප්ත වන විප්ලවීය අවස්ථා, එක්තරා කාලයක් සමකාලීන ජීවමාන යථාර්ථය හා සම්පස්ථ වසයෙන් නො බැඳුනු, එක්තරා දුරකට දුරස්ථ වියුක්තයන් සේ පෙනී යාමට අවකාශ පැවති දේවලට, පූර්න සංයුක්ත භාවයක් අත්පත් කර දී ඇත්තේ දැන් පමනි. සත්‍යය නම්, මෙම මූල ධර්ම, දේශපාලන විශ්ලේෂනයෙහි හා ප්‍රායෝගික ක්‍රියා කාරිත්වයෙහි ගමන් මග නිර්නය කිරීමෙහි දැන් වැඩෙන බලයකින් යුතු ව පිහිටා සිටීම යි.

## පැබ්ලෝගේ සංශෝධනවාදය

මෙම මූල ධර්ම පැබ්ලෝ විසින් අත්හැර දමනු ලැබ ඇත. නව ම්ලේච්ඡත්වයක අනතුර අවධාරනය කරනු වෙනුවට ඔහු සමාජවාදය දිශාවට ඇති තල්ලුව "ආපසු නො හැරවිය හැකි වුවක්" සේ දකියි; එසේ වෙතත් ඔහු අපගේ පරම්පරාවෙහි දී හෝ එලඹෙන පරම්පරා කිහිපයක දී හෝ සමාජවාදය සමාප්ත වන බවක් ද නො දකී. ඒ වෙනුවට ඔහු "විකෘත" එනම් "ශත වර්ෂ ගනනාවක්" පවතින, ස්ටැලින් වර්ගයේ කම්කරු රාජ්‍යවලට විනා අනෙකකට සම්භවය නො සපයන "ගලා බස්නා" විප්ලව රැල්ලක් පිලිබඳ සංකල්පය ඉදිරිපත් කොට ඇත.

මෙය කම්කරු පන්තියේ ශක්තීන් පිලිබඳ පරිපූර්න

අසාර දැක්ම අනාවරනය කරයි; එය ස්වාධීන විප්ලවීය සමාජවාදී පක්ෂ ගොඩනැංවීමේ අරගලය සම්බන්ධයෙන් ඔහු මැත දී කල සරදම් හා සපුරා ගැලපෙන්නේ ය. සියලුම උපායාත්මක ක්‍රම මගින් ස්වාධීන විප්ලවීය සමාජවාදී පක්ෂ ගොඩනැගීමේ ප්‍රධාන මාවතට බැඳී සිටිනු වෙනුවට, ට්‍රොට්ස්කිවාදයේ "අදහස්" හා "ක්‍රියාමාර්ගය" පිලිගැනීමට හැකි වන පරිදි මහජන පීඩනය යටතේ ස්ටැලින්වාදී නිලධරය නැතහොත් එහි තීරනාත්මක කොටසක් වෙනස් වනු ඇතැයි කියමින් ඔහු ඒ වෙත බලාපොරොත්තු රඳවයි. ප්‍රන්සය බඳු රටවල ස්ටැලින්වාදයේ කඳවුරෙහි කම්කරුවන් වෙත ළඟාවීමට ඕනෑ වන උපායාත්මක උපාමාරුවල දී අවශ්‍ය වන නම්‍ය භාවයේ ආවරනය යටතේ ඔහු දැන් ස්ටැලින්වාදයේ පාවා දීම් ආවරනය කරයි.

මෙම මාවත දැනට මත්, ට්‍රොට්ස්කිවාදයේ සේනාංක කෙරෙන් ස්ටැලින්වාදයේ කඳවුරට පලා යාම් උද්ගත කර ඇත. මෙය බැරෑරුම් කොට තැකිය යුතු ය. ලංකාවේ පක්ෂය තුල ඇති වූ ස්ටැලින්වාදයට නැඹුරු භේදය, පැබ්ලෝවාදය විසින් ස්ටැලින්වාදය පිලිබඳ ව වගා දිගා කෙරෙන මිථ්‍යාවන්හි බේදජනක ප්‍රතිඵල සම්බන්ධයෙන් සියලු තන්හි සිටින ට්‍රොට්ස්කිවාදීන්ට අනතුරු ඇඟවීමක් කරයි.

තවත් ලේඛනයකින් අපි පැබ්ලෝගේ සංශෝධනවාදය පිලිබඳ ව විස්තරාත්මක විශ්ලේෂණයක් ඉදිරිපත් කරන්නෙමු. මෙම ලිපියෙන් අපි මෑත කාලීන පරීක්ෂන කිහිපයකට සීමා වන්නෙමු; භාවිතය පිලිබඳ තීරනාත්මක ක්ෂේත්‍රයෙහි, පැබ්ලෝ, සංශෝධනවාදය හා සන්ධාන ගත වීමෙහි කෙතෙක් දුර ගමන් කොට ඇද්ද යන්නත් හතර වන ජාත්‍යන්තරයේ පැවැත්මට එල්ල කෙරී ඇති තර්ජනය කෙතරම් බැරෑරුම් ද යන්නත් එම පරීක්ෂන මගින් පෙන්නුම් කෙරේ.

ස්ටැලින්ගේ මරනයත් සමග ම, ක්‍රෙම්ලිනය, ස්වරූපයෙන් දේශපාලනික නො වූ සහන මාලාවක් ම එක්සත් සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමය තුල ප්‍රකාශයට පත් කලේ ය. මේවා, බලය කොල්ලකා ගත් නිලධරය, තව දුරටත් බල සම්පන්න වීමේ අරමුනින් ක්‍රියාත්මක කරන උපාමාරුවක කොටසක් හා නායක නිලධරයෙකුට ස්ටැලින්ගේ අක්ත පත්‍ර අත්පත් කර ගැනුමේ සූදානමෙහි කොටසක් ද විනා අන් කිසිවක් නො වන්නේ යැයි හඳුන්වා දෙනු වෙනුවට පැබ්ලෝවාදී කන්ඩායම, මෙකී සහන වලංගු කාසි හැටියට රැගෙන, දේශපාලනික සහන හැටියට පින්තාරු කොට, ස්ටැලින්වාදී නිලධරය කම්කරුවන් හා "බලය බෙදා හදා ගැනුමෙහි" හැකියාවක් ද ප්‍රක්ෂේපනය කලේ ය (*Fourth International* - ෆෝත් ඉන්ටර් නැෂනල්, ජනවාරි-පෙබරවාරි, 1953 පි. 13)

පැබ්ලෝ ලභ්ධියෙහි අග්‍ර පූජකයකු වූ ක්ලාක්, කිසි ම ගරුසරුවකින් තොර ව ප්‍රචාරය කල, බලය බෙදා හදා ගැනුම පිලිබඳ සංකල්පය, පිලිතුරු නො සැපයුනු එහෙත් පැහැදිලි ව ම ප්‍රමුඛත්වය දැරූ ප්‍රශ්නයක ලා පැබ්ලෝ විසින් ම ධර්ම පාඨයක් හැටියට වක්‍ර ලෙස සම්මත කරනු ලැබුනි: පැබ්ලෝ මෙසේ ප්‍රශ්න කරයි - ස්ටැලින්වාදී පාලන තන්ත්‍රය දිය කර හැරීම, "ආපසු හැරීමට නො වේ නම් පවතින තත්වය රැක ගැනීමට සටන් වදින කොටස් හා මහජනතාවගේ බලගතු පීඩනයෙන් ආකර්ෂනය කරනු ලැබෙන එන්ට එන්ට ම සංඛ්‍යාත්මක ව වැඩි වන කොටස් අතර ප්‍රචන්ඩ අන්තර්-නිලධාරී තාන්ත්‍රික අරගලවල ස්වරූපය ගනී ද?" (*Fourth International* - ෆෝත් ඉන්ටර් නැෂනල්, මාර්තු - අප්‍රේල්, 1953 පි. 39)

මෙම චින්තන ක්‍රමය, ක්‍රෙම්ලින් නිලධරයට විරුද්ධ දේශපාලනික විප්ලවය පිලිබඳ සම්ප්‍රදායික ට්‍රොට්ස්කිවාදී ක්‍රියා මාර්ගය, නව අන්තර්ගතයකින් පුරවාලයි; එනම්, ට්‍රොට්ස්කිවාදයේ "අදහස්" හා "ක්‍රියා මාර්ගය" නිලධරයට නැතහොත් එහි තීරනාත්මක කොටසක් තුලට පෙරී ගොස්, ව්‍යාප්ත ව, ඒ අයුරින් පෙර නො දක්නා ලද ආකාරයකට ස්ටැලින්වාදය "පෙරලා දමනු ලැබේ ය" යන සංශෝධනවාදී ආස්ථානය යි.

ජුනි මාසය තුල නැගෙනහිර ජර්මනියේ කම්කරුවෝ, ජර්මානු ඉතිහාසයෙහි ඇති වූ දැවැන්ත ම පෙලපාලියකින් ස්ටැලින්වාදී ආධිපත්‍යයෙන් යුත් ආන්ඩුවට විරුද්ධ ව නැගී සිටියහ. මෙය ස්ටැලින්වාදය සෝවියට් සමූහාන්ඩුව තුල බලය කොල්ලකා තහවුරු වීමෙන් පසු ව, එයට විරුද්ධ ව උද්ගත වූ ප්‍රථම කම්කරු පන්තික මහජන නැගිටීම යි. පැබ්ලෝ මෙම යුග කාරක නැගිටීමට ප්‍රතිචාර දැක්වූයේ කෙසේ ද?

කැරලිකාර නැගෙනහිර ජර්මානු කම්කරුවන්ගේ විප්ලවීය දේශපාලනික අවශ්‍යතාවන්ට පැහැදිලි ප්‍රකාශනයක් දෙනු වෙනුවට, නැගිටීම මර්දනය කරනු වස් සෝවියට් සේනාංක බලමුලු ගැන්වූ ප්‍රතිවිප්ලවවාදී ස්ටැලින්වාදී ප්‍රාදේශික බලකාරයන්ට පැබ්ලෝ ආවරනය සැපයී ය. "..... සෝවියට් නායකයන්ට, විවිධාකාර වූ 'ජනතා ප්‍රජාතන්ත්‍රවාදයන්'හි හා කොමියුනිස්ට් පක්ෂවල නායකයන්ට තව දුරටත් මෙම සිදුවීම්වල ගැඹුරු අර්ථය විකෘත කිරීමට හෝ නො තකා හැරීමට නුපුලුවන් විය. මහජනතාවගේ සහයෝගයෙන් තමන් සඳහට ම පරත්වාරෝපනය වීමේ අනතුර වැලැක්වීමට හා වඩාත් බල සම්පන්න පිපිරීම් ප්‍රකෝප කරවීමෙන් වැලකීම පිනිස වඩාත් විශාල වූ ද නිර්ව්‍යාජ වූ ද සහන සැලසීමේ මාවත දිගේ ම පෙරට යාමට නිලධරයට සිදු වී ඇත. මෙතැන් සිට ඔවුන්ට භාග දුරක් ගොස් නතර වීමට නුපුලුවන් වනු ඇත. ආසන්න අනාගතයෙහි වඩාත් බැරෑරුම් පිපිරීම් ඇති වීම වැලැක්වීම සඳහාත් හැකි නම්, වර්තමාන තත්වයෙන් මහජනයාට වඩා ඉවසා දරා සිටිය හැකි තත්වයකට මාරු වීමක් "ඇල්මැරුනු ආකාරයකින් ලබා දීම සඳහාත් සහන බෙදා හැරීමට ඔවුන්ට බල කෙරෙනු ඇත." ( *Fourth International* - හතර වන ජාත්‍යන්තරයේ [ජාත්‍යන්තර ලේකම් මන්ඩලයේ] ප්‍රකාශනය. ජූලි 6 වන දා මිලිටන්ට් පුවත් පතෙහි ප්‍රසිද්ධ කෙරුනි).

සෝවියට් සේනාංක — ස්ටැලින්වාදී ආන්ඩුවට පිටුබලය සැපයූ එක ම බල වේගය — ඉවත් කර ගත යුතු යැයි උද්ඝෝෂනය කරනු වෙනුවට, පැබ්ලෝ, "වඩාත් විශාල වුත්, නිර්ව්‍යාජ වුත් සහන" ක්‍රෙම්ලිනයේ කානු කෙරෙන් උද්ගත වනු ඇතැයි යන මිථ්‍යාව වගාදිගා කලේ ය. කැරලි ගසන කම්කරුවන් "ෆැසිස්ට්වාදීන්" හා

"ඇමරිකානු අධිරාජ්‍යවාදයේ ඒජන්තයින්" ලෙස හංවඩු ගසමින්, ඔවුන්ට විරුද්ධ ව මිලේච්ඡ මර්ධන රැල්ලක් දියත් කරමින්, මෙම සිදුවීම්වල ගැඹුරු අර්ථය දැවැන්ත ලෙස විකෘත කිරීමට පෙරට යන මොස්කෝවට මීටත් වඩා හොඳ ආධාරෝපකාරයක් අපේක්ෂා කල හැකි ද?

## ප්‍රන්ස මහා වැඩ වර්ජනය

අගෝස්තු මාසයේ දී ප්‍රන්සය තුල එරට ඉතිහාසයෙහි දැවැන්ත ම මහා වැඩ වර්ජනය පුපුරා ගියේ ය. නිල නායකත්වයෙහි ඕනෑකමට පිටින් කම්කරුවන් විසින් ම ක්‍රියාත්මක කෙරුනු එම වර්ජනය, බලය සඳහා සැබෑ අරගලයක වර්ධනය උදෙසා, කම්කරු පන්ති ඉතිහාසයෙහි විවෘත වූ අතිශයින් ම වාසි දායක අවස්ථාවන්ගෙන් එකක් විය. කම්කරුවන් හැරුනු විට, ඔවුන් පසුපසින්, ප්‍රන්සයේ ගොවීහු ද ධනේශ්වර ආන්ඩුව කෙරෙහි ඔවුන්ගේ බලගතු අතෘප්තිය අගවමින් පෙලපාලි දැක්වූහ.

සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන් හා ස්ටැලින්වාදීන් යන දෙයාකාර වූ ම නිල නායකත්වය, ව්‍යාපාරය රඳවා, ප්‍රන්ස ධනේශ්වර ක්‍රමයට පවතින අනතුර මග හැරවීමට ඔවුන්ට හැකි සෑම දෙයක් ම කරමින්, මෙම ව්‍යාපාරය පාවා දුන්හ. උද්ගත ව පැවති අවස්ථාවෙහි පරිමානයෙන් මැන බලන්නේ නම්, පාවා දීම් පිලිබඳ ඉතිහාසයෙහි මීටත් වඩා දුෂ්ට වූ පාවා දීමක් සොයා ගැනුම අපහසු වනු ඇත.

පැබ්ලෝ කන්ඩායම, මෙම දැවැන්ත සිදුවීමට ප්‍රතිචාර දැක්වූයේ කෙසේ ද? ඔව්හු සාමජ ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ ක්‍රියාව පාවා දීමකැයි ලේබල් ගැසූහ - එහෙත් වැරදි හේතු මත ය. පාවා දීම සමන්විත වූයේ, ස්ටැලින්වාදීන්ට හොරෙන් ආන්ඩුව හා සාකච්ඡා පැවැත්වීමෙන් යැයි ඔව්හු ප්‍රකාශ කලහ. කෙසේ වෙතත් මෙම පාවා දීම, බලය ගැනීමේ මාවතට අවතීර්න වීම ප්‍රතික්ෂේප කිරීමේ ඔවුන්ගේ මුඛ්‍ය අපරාධයෙන් ගලා ආ ද්විතියික එකක් විය.

ස්ටැලින්වාදීන් පිලිබඳ ව පැවසිය යුත්තේ ඔවුන්ගේ පාවා දීම පැබ්ලෝවාදීන් විසින් ආවරනය කෙරුනු බව යි. එම ක්‍රියාව මගින් පැබ්ලෝවාදීහු ස්ටැලින්වාදී පාවා දීමෙහි හවුල්කරුවන් බවට පත් වූහ. ස්ටැලින්වාදීන්ගේ ප්‍රතිවිප්ලවවාදී මාවතට විරුද්ධ ව ඔවුන්ට එල්ල කල හැකි වූ තියුනු ම විවේචනය නම් පිලිවෙතක් "නොමැති වීම" ගැන චෝදනා කිරීම ය.

මෙය මුසාවක් විය. ස්ටැලින්වාදීන්ට පිලිවෙත්වලින් "අඩුවක්" නො විය. ඔවුන්ගේ පිලිවෙත වූයේ ක්‍රෙම්ලිනයේ විදේශ පිලිවෙතෙහි අවශ්‍යතාවන්ට අනුකූල ව පවතින තත්වය පවත්වා ගෙන යාමත් එසේ කිරීමෙන් ගරා වැටෙන ප්‍රන්ස ධනේශ්වර ක්‍රමය ඔසවා තැබීමට ආධාර කිරීමත් ය.

එපමනක් නො වේ. ප්‍රන්ස ට්‍රොට්ස්කිවාදීන්ගේ පක්ෂාභ්‍යන්තරික අධ්‍යාපනය සඳහා වත් ස්ටැලින්වාදී කාර්ය භාරය පාවා දීමක් ලෙස හඳුන්වා දීම පැබ්ලෝ විසින් ප්‍රතික්ෂේප කෙරින. "සාම්ප්‍රදායික සංවිධානවල නායකත්වය විසින් ඒ හෝ මේ පරිමානයෙන් ඉෂ්ට කෙරුනු තිරිංගයේ කාර්ය භාරය" — පාවා දීමක් වනාහි හුදු "තිරිංග දැම්මකි!" — ඔහු සැලකිල්ලට ගත්තේ ය. "එහෙත් ඔවුන්ගේ — විශේෂයෙන් ම ස්ටැලින්වාදී නායකත්වයෙහි — ශක්තියත්" ඔහු සැලකිල්ලට ගත්තේ ය. "එනම්, මෙම වර්ජන සමයෙහි සිදු වූ අයුරින්, මහජන පීඩනය බලගතු වන කල්හි, එම පීඩනයට යටත් වීමට, විශේෂයෙන් ම ස්ටැලින්වාදී නායකත්වයට පවතින ශක්තිය යි." (දේශපාලන සටහන, නො 1)

සාම්ප්‍රදායික ට්‍රොට්ස්කිවාදය අත් හල එහෙත් තවමත් හතර වන ජාත්‍යන්තරයේ ආවරනය පතන නායකයකුගෙන් ස්ටැලින්වාදයට ලැබෙන සෑහෙන තරම් වූ සහනයක් හැටියට කෙනෙකු මෙය සලකනු ඇත. කෙසේ වෙතත් පැබ්ලෝ තවත් දුර දිග ගියේ ය.

## කුප්‍රකට පත්‍රිකාව

පැරිසියේ රෙනෝල්ට් වැඩ පලෙහි කම්කරුවන් අමතා පැබ්ලෝගේ අනුගාමිකයන් නිකුත් කල පත්‍රිකාවක්, මහ වැඩ වර්ජනයේ දී, සී.ජී.ටී. සංවිධානය (ප්‍රන්සයේ ප්‍රධාන වෘත්තිය සමිති සම්මේලනය) "කම්කරුවන්ට අවශ්‍ය වන ඉල්ලීම්වලට අතිරේක ව වෙනත් ඉල්ලීම් ඉදිරිපත් නො කිරීම සම්බන්ධයෙන් නිරවද්‍ය වන්නේ ය" යි ප්‍රකාශ කර සිටියේ ය. ඔවුන් මෙසේ කලේ, කම්කරුවන් ඔවුන්ගේ ක්‍රියාවන් මගින් කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ආන්ඩුවක් ඉල්ලා සිටිද්දී ය.

ස්ටැලින්වාදී නායකත්වයෙන් යුත් වෘත්තිය සමිති හා කොමියුනිස්ට් පක්ෂය හිතුමනාපයට එකිනෙකින් වෙන් කරමින් — අතිශයින් ම යාන්ත්‍රික චින්තනයක් පිලිබඳ සාක්ෂි හෝ ස්ටැලින්වාදීන්ට ආවරනය සැපයීම පිලිබඳ ව හිතාමතා ඇති කර ගත් සැලසුමක් පිලිබඳ සාක්ෂි? — පැබ්ලෝවාදීන් ඔවුන්ගේ පත්‍රිකාවෙන් කියා සිටියේ වර්ජනයේ හා එහි ඉදිරි දර්ශනවල අදාලත්වය සම්බන්ධයෙන් සලකන තාක් දුරට "මෙම කරුන වෘත්තිය සමිති සම්බන්ධයෙන් අදාල වූයේ ද්විතීයික ව පමනක්" බව ය.

"මෙම කරුන පිලිබඳ ව කරනු ලැබෙන විවේචනය වෘත්තිය සමිති සංවිධානයක් වන සී.ජී.ටී. යට එල්ල නො වන්නේ ය. වෘත්තිය සමිතියක් ප්‍රමුඛ ලෙස හා ප්‍රථ ම ලෙස ක්‍රියා කල යුත්තේ වෘත්තිය සමිතියක් හැටියට ය. මෙම විවේචනය එල්ල වනුයේ, මෙම ව්‍යාපාරයේ ගැඹුරු දේශපාලනික අදාලත්වය හා එහි ඵල විපාක පෙන්වා දීම තමන්ගේ කාර්ය භාරය කර ගත් පක්ෂවලට ය." (කම්කරු සංවිධාන හා රෙනෝල්ට් කම්කරුවන් සඳහා ලියැවුනු පත්‍රිකාව, දිනය සැප්තැම්බර් 3, 1953. අත්සන් කලේ ෆ්‍රෑන්ක්, මෙස්ත්‍රි හා ප්‍රිවාස්).

ධනේශ්වර ක්‍රමයේ මර ලතෝනිය පිලිබඳ යුගයෙහි වෘත්තිය සමිතිවල කාර්ය භාරය හා වග කීම් පිලිබඳ ව ට්‍රොට්ස්කි අපට ඉගැන්වූ සෑම දෙයක් ම සපුරා ම අත්හැර දැමීමක් අපට මෙම ප්‍රකාශනයන්හි දිස් වෙයි.

ඉක්බිති ව පැබ්ලෝවාදී පත්‍රිකාව ප්‍රන්ස කොමියුනිස්ට් පක්ෂය විවේචනය කරනුයේ එයට පිලිවෙතක් නොමැති වීම ගැන ය; "ධනේශ්වර වංචනයෙන් රට බේරා ගෙන සමාජවාදයට දොරටුව විවෘත කරනු පිනිස කම්කරු බලය

පිලිබඳ ගැටලුව මතු කෙරෙන ඉමහත් පන්ති අරගලයකට පූර්විකාව (!) වන, ප්‍රන්ස සමාජයීය අර්බුදයේ වැදගත් අදියරක් (!) මෙම වර්ජනයෙන් ඉදිරිපත් වන බව කම්කරුවන්ට පැහැදිලි කර දෙනු වෙනුවට තමන් සරල ව ම වෘත්තීය සමිති ව්‍යාපාරයේ මට්ටමෙහි පිහිටුවා ගැනීම'' ගැන ය.

යම් හෙයකින් රෙනෝල්ට් කම්කරුවන් පැබ්ලෝවාදීන් විශ්වාස කරතොත් ප්‍රන්ස ස්ටැලින්වාදී නිලධරයේ දෝෂය වනුයේ ප්‍රන්ස ඉතිහාසයෙහි දැවැන්ත ම මහා වැඩ වර්ජනය සිතාමතා පාවා දීම සම්බන්ධ ව නො ව, සින්ඩිකල්වාදී මාත්‍රයක් සම්බන්ධ ව පමනි.

සී.ජී.ටී. නායකත්වයේ පිලිවෙතට පැබ්ලෝ දක්වන අනුමැතිය විශ්වාස කල නො හැකි තරම් ය. එහෙත් මග නො හැරිය හැකි කරුන දෙනෙත් හමුවෙහි ම පවතී. ප්‍රන්සයේ දක්නට ලැබුනු දැවැන්ත ම මහා වැඩ වර්ජනයෙහි දී පැබ්ලෝ, වෘත්තීය සමිති, දේශපාලනයෙන් පරිබාහිර ව තබා ගැනුම පිලිබඳ ගොම්පර්ස්ගේ ධනේශ්වර පිලිවෙතෙහි ප්‍රන්ස අනුවාදයක් ''නිවැරදි වන්නේ යැ'' යි මෘදු ලෙස කියා පායි. ඒ 1953 දී ය!

සී.ජී.ටී. නායකත්වයට, ගොවියන්ගේ හා කම්කරුවන්ගේ ආන්ඩුවක් ගොඩනැගීම ඇතුලු ව වෛෂයික අවශ්‍යතාවන්ට අනුරූප දේශපාලනික ඉල්ලීම් ඉදිරිපත් කිරීම සාවද්‍ය වන්නේ නම් සමාජවාදී කම්කරු පක්ෂය ඇමරිකානු වෘත්තීය සමිති ව්‍යාපාරයේ අද දවසේ ගොම්පර්ස්ගෙන් ඔවුන් ලේබර් පක්ෂයක් සංවිධාන කරන ලෙස ඉල්ලා සිටිනුයේ මන්ද? එනම්, එක්සත් ජනපදයෙහි කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ආන්ඩුවක් බලයට පත් කිරීම අරමුනු කර ගත් ලේබර් පක්ෂයකි.

පැබ්ලෝගේ අනුමැතිය හගවන රබර් මුද්‍රාව වඩාත් අමුතු ආලෝකයකින් දිස් වනුයේ සී.ජී.ටී නායකත්වය ඉහලින් ම දේශපාලනික වන බව අප අපට ම සිහි පත් කර ගත් විට ය. එය, ක්‍රෙම්ලිනයෙන් ලැබෙන කුඩා ම සංඥාවෙහි දී පවා ඕනෑ ම අවිනය සහගත දේශපාලනික වික්‍රමයකට කම්කරුවන් එලියට කැඳවීමට සූදානමින් සිටී. නිදර්ශන වසයෙන්, පසුගිය වසරෙහි රිජ්වේ විරෝධී පෙලපාලි දැක්වීම් මගින් ආරම්භකත්වය දෙනු ලැබුනු සිදුවීම්වල දී සී.ජී.ටී. නායකත්වයෙහි කාර්ය භාරය මතකයට නගා ගන්න. කොමියුනිස්ට් පක්ෂයේ නායකයකු වූ ඩුක්ලෝස් සිර අඩස්සියට ගනු ලැබුනු අවස්ථාවෙහි රට විරෝධය පෑම පිනිස වැඩ වර්ජන කැඳවාලීමට මෙම ස්ටැලින්වාදී වෘත්තීය සමිති පුද්ගලයන් පසුබට වූයේ නැත.

සත්‍යය නම්, සී.ජී.ටී. නායකත්වය තමන්ගේ ඉහලින් ම දේශපාලනමය වූ ස්වරූපය මෙම මහා වැඩ වර්ජනයෙහි දී යලි වතාවක් අනාවරනය කිරීම යි. වසර ගනනාවක ද්‍රෝහීත්වයෙන් හා දෙපිටකාට්ටුකමෙන් ලද මුලු මහත් කුශලතාව මෙහෙයවා ගනිමින් එය කම්කරුවන් ආපසු හරවා යැවීමට, ඔවුන්ගේ ආරම්භකත්වය මොට කිරීමට, කම්කරුවන්ගේ දේශපාලනික ඉල්ලීම් පුපුරා එලියට ඒම වලක්වාලීමට සිතාමතා ම උත්සාහ කලේ ය. ස්ටැලින්වාදී වෘත්තීය සමිති නායකත්වය දැනුවත් ව පාවා දුන්නේ ය. පැබ්ලෝ, නිරවද්‍ය යැයි පවසනුයේ පාවා දීමේ මෙම ක්‍රියා මාර්ගය යි.

තතු මෙපමනකිනුත් හමාර නො වේ. පැබ්ලෝවාදී පත්‍රිකාවෙහි ප්‍රධාන අරමුනුවලින් එකක් වනුයේ රෙනෝල්ට් ෆැක්ටරියේ වර්ජනය සමයෙහි නිර්ව්‍යාජ විප්ලවවාදීන් හැටියට ක්‍රියාත්මක වුනු ප්‍රන්ස ට්‍රොට්ස්කිවාදීන් හෙලාදැකීම යි. හතර වන ජාත්‍යන්තරයෙන් හා එහි ප්‍රන්ස ශාඛාවෙන් වසරකට වැඩි කාලයකට නෙරපනු ලැබ සිටි සහෝදරවරුන් දෙදෙනෙකු ගැන එය වෙසෙසින් නම් කරයි. මෙම ''කන්ඩායම අවිනය සහගත කටයුතුවල නිරත වීමේ හේතුවෙන් නෙරපනු ලැබුනු බව'' එය සඳහන් කරයි. එහි වැඩි දුරටත් සඳහන් වනුයේ, ''මෙම කන්ඩායමේ නැඹුරුව — විශේෂයෙන් ම පසුගිය වර්ජන ව්‍යාපාරය සමයෙහි — පී.සී.අයි. සංවිධානය (හතර වන ජාත්‍යන්තරයේ ප්‍රන්ස ශාඛාව) විසින් තත්‍ය වසයෙන් ආරක්ෂා කරනු ලැබූ ක්‍රියා මාර්ගයට වෙනස් වන බව ය. ''කන්ඩායම'' යන්නෙන් මෙහි දී සැබවින් ම අදහස් කරනු ලැබෙනුයේ පැබ්ලෝ විසින් අත්තනෝමතික ලෙස හා අයුක්ති සහගත ලෙස පලවා හරිනු ලැබුනු හතර වන ජාත්‍යන්තරයේ ප්‍රන්ස ශාඛාවෙහි බහුතරය යි.

ලෝක ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය මින් පෙර කවර කලෙක හෝ මෙබඳු අපචාරයක් එනම්, ස්ටැලින්වාදීන් වෙනුවෙන් ට්‍රොට්ස්කිවාදීන් නිල වසයෙන් හෙලාදැකීම හා ජුගුප්සජනක ස්ටැලින්වාදී පාවා දීම් කම්කරුවන් හමුවෙහි යුක්ති සහගත කිරීම බඳු අපචාරයක් ගැන අසා තිබේ ද?

ස්ටැලින්වාදීන් හමුවෙහි, පැබ්ලෝවාදීන් මෙම සහෝදරවරුන් හෙලා දුටුවේ, රෙනෝල්ට් කර්මාන්ත ශාලාවෙහි ට්‍රොට්ස්කිවාදීන්ට ස්ටැලින්වාදීන් එල්ල කල මඩ ගැසීම්වලින් කම්කරු අධිකරනයක් මගින් ට්‍රොට්ස්කිවාදීන් නිදොස් කෙරුනු පසු ව බව මෙහි දී සඳහන් කල යුතු ය.

### ඇමරිකානු පැබ්ලෝවාදීන්

අපේ අදහසට අනුව, මෙම ලෝක සිද්ධි පිලිබඳ පරීක්ෂනය ම, ස්ටැලින්වාදය කෙරෙහි පැබ්ලෝවාදීන් තුල වූ මිත්‍රශීලීත්වයේ ගැඹුර ඇගවුම් කිරීමෙහි ලා ප්‍රමානවත් ය. එහෙත් ලෝක ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ ප්‍රසිද්ධ පරීක්ෂනයට තවත් කරුනු කිහිපයක් ඉදිරිපත් කිරීමට අපි කැමැත්තෙමු.

වසර එකහමාරකට වැඩි කාල පරිච්ජේදයක් මුලුල්ලේ, සමාජවාදී කම්කරු පක්ෂය, කොක්රාන් හා ක්ලාක් විසින් නායකත්වය දෙනු ලැබෙන සංශෝධනවාදී ප්‍රවනතාවකට විරුද්ධ ව අරගලයක නිරත ව සිටී. මෙම ප්‍රවනතාවට විරුද්ධ අරගලය, අප පක්ෂයේ ඉතිහාසයෙහි අතිශයින් ම උග්‍ර අරගලයන්ගෙන් එකක් විය. මෙහි දීත් පතුලෙහි ම ඇත්තේ, දෙවන ලෝක යුද්ධය ආරම්භයෙහි හා අවසානයෙහි, අප, බර්න්හැම්-ෂැට්මන් කන්ඩායමෙන් හා මොරෝ-ගෝල්ඩ්මන් කන්ඩායමෙන් බෙදා වෙන් කල එම මූලික ප්‍රශ්න ම ය. මෙය වනාහි අපගේ මූලික ක්‍රියා මාර්ගය සංශෝධනය කිරීමෙහි හා අත්හැර දැමීමෙහි තවත් ප්‍රයත්නයකි. මෙය ඇමරිකානු විප්ලවයේ ඉදිරිදර්ශනය ද

විප්ලවවාදී පක්ෂයේ ස්වභාවය එහි කාර්යභාරය හා සංවිධානාත්මක විධි ක්‍රමය ද ලෝක ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය සඳහා ඉදිරි දර්ශන ද වෙලා ගෙන සිටී.

පශ්චාත් යුද්ධ කාල පරිච්ඡේදයෙහි බල සම්පන්න නිලධරයන් තමන් ඇමරිකානු කම්කරු ව්‍යාපාරය තුල තහවුරු විය. මෙම නිලධරය රඳා සිටින්නේ යුද්ධ සෞභාග්‍යයේ කොන්දේසි විසින් "මෘදු" කරවන ලද විශාල වරප්‍රසාදිත සාම්ප්‍රදායික කම්කරු ස්ථරයක් මත ය. මෙම නව වරප්‍රසාදිත ස්ථරය බොහෝ දුරට ම දිනා ගනු ලැබුනේ, සී.අයි.ඕ. සංවිධානයට පදනම දැමූ එම පරම්පරාවෙන් ම, කම්කරු පන්තියෙහි මුල් සටන්කාමී කන්ඩායම්වල අනුගාමිකත්වයන් කෙරෙන් ම ය.

පූර්වයෙන් සියලු ම සටන් කාමී පන්ති ක්‍රියාවන්හි පෙරටුවෙන් ම සිටි මෙම කම්කරුවන්ගේ සටන්කාමීත්වය හා ආරම්භකත්වය ගැනීම, ඔවුන්ගේ ජීවන කොන්දේසිවල සාපේක්ෂ සුරක්ෂිත භාවය හා ස්ථාවරත්වය විසින් තාවකාලික ව හිරිවට්ටනු ලැබ ඇත.

කොක්රාන්වාදය වනාහි, සුලු ධනේශ්වර දෘෂ්ටිවාදයකින් යුක්ත මෙම නව ලේබර් රදල යන්ත්‍රය කම්කරු පන්තික පෙරමුනු බල ඇනිය මත මුදා හරින පීඩනයේ ප්‍රකාශනය වෙයි. නිෂ්ක්‍රිය, සාපේක්ෂ වසයෙන් තෘප්තිමත් කම්කරු ස්ථරයෙහි මනෝගති හා ප්‍රවනතා අපගේ ව්‍යාපාරය තුලට හතුරු පීඩනයක් සන්නිවේදනය කරවන බලගතු යන්ත්‍රනයක් හැටියට ක්‍රියාත්මක වෙයි. 'පැරනි ට්‍රොට්ස්කිවාදය සුන්බුන් ගොඩට දමනු' යන කොක්රාන්වරුන්ගේ සටන් පාඨයෙන් මෙම මනෝගතිය ප්‍රකාශයට පත් වෙයි.

කොක්රාන්වාදී ප්‍රවනතාව ඇමරිකානු කම්කරු පන්තියේ බලගතු විප්ලවීය ශක්තිය දකිනුයේ දුරස්ත අනාගත අපේක්ෂාවක් හැටියට ය. ඔව්හු ඇමරිකානු කම්කරු පන්තිය තුල නව සටන්කාමී හට කන්ඩායම්වල උද්භවය ලබා දෙන අනුක ප්‍රවර්තන අනාවරනය කරන මාක්ස්වාදී විශ්ලේෂණය, "කට්ටිවාදී" යැයි හෙලාදකිති.

එක්සත් ජනපදයේ මොනයම් හෝ ප්‍රගතිශීලී ප්‍රවනතා පවතින තාක් දුරට ඔවුන් ඒවා දකිනුයේ හුදෙක් ස්ටැලින්වාදයේ අනුගාමිකත්වයන් තුල හෝ එහි වාටියෙහිත් "ඔපමට්ටමින් යුත්" වෘත්තිය සමිති දේශපාලනඥයන් අතරෙහිත් ය — පන්තියෙහි සෙසු කොටස, කෙතරම් නම් බලාපොරොත්තු විරහිත ලෙස නිද්‍රෝපගත ව සිටිති යි ඔවුන් විසින් සැලකෙන්නේ දැයි කිව හොත් — ඔවුන්ට අනුව පන්තියෙහි මෙම කොටස අවදි කල හැකි වනුයේ හුදෙක් න්‍යෂ්ටික යුද්ධයක කම්පනයෙන් ම පමනි.

සංක්ෂිප්ත ව පැවසුවොත්, ඔවුන්ගේ ආස්ථානයෙන් අනාවරනය වනුයේ: ඇමරිකානු විප්ලවයේ ඉදිරි දර්ශනය කෙරෙහි විශ්වාස භංගත්වය යි; විප්ලවවාදී පක්ෂයේ කාර්ය භාරය පිලිබඳ ව සාමාන්‍ය වසයෙනුත් කම්කරු පක්ෂයේ කාර්ය භාරය පිලිබඳ ව විශේෂ වසයෙනුත් විශ්වාස භංගත්වය යි.

**කොක්රාන්වාදයේ අංග ලක්ෂන**

ලෝක ව්‍යාපාරයේ සියලු ම අංශ, තමන්ගේ දැඩි දුෂ්කර අත්දැකීම්වලින් මැනවින් දන්නා පරිදි, දිග්ගැස්සුනු යුද්ධ සෞභාග්‍යයට හා එක්සත් ජනපදයේ අප පෙලන්නා වූ ප්‍රති විප්ලවීය රැල්ලට වඩා බෙහෙවින් දැවැන්ත වූ පීඩන පවතී. එහෙත් ඉතාමත් ම දුෂ්කර කොන්දේසි යටතේ කේඩරයන් ජීවමාන ව පවත්වා ගෙන යනුයේ අපගේ ව්‍යාපාරයේ න්‍යායික නිරවද්‍ය භාවය පිලිබඳ ව පවත්නා දැවෙන ඒත්තු ගැනීම යි; අපගේ ව්‍යාපාරයේ න්‍යායික නිරවද්‍ය භාවය කම්කරු පන්තියේ ඓතිහාසික කාර්ය භාරය පෙරට ගෙන යාමෙහි ලා පවත්නා ජීවමාන සාධකය වන්නේ ය යන අවබෝධය යි; මානව වර්ගයාගේ ඉරනම ඒ හෝ මේ පරිමානයට අපගේ කටයුතු මත රඳා පවත්නේ ය යන වැටහීම යි; ක්ෂනික කොන්දේසි කෙබඳු වුවත් ඓතිහාසික වර්ධනයේ ප්‍රධාන මාවත විසින්, ජයග්‍රාහී සමාජවාදී විප්ලවයක් මගින් මානව වර්ගයාගේ අර්බුදය විසඳාලන ලෙනින්වාදී සටන් පක්ෂ නිර්මානය කිරීම ඉල්ලුම් කෙරෙන්නේ ය යන ස්ථිරසාර විශ්වාසය යි.

කොක්රාන්වාදය වනාහි මෙම සම්මත ට්‍රොට්ස්කිවාදී ලෝක දෘෂ්ටිය වෙනුවට සංශයවාදය, න්‍යායික වේල පිරිමසා ගැනීම් හා මාධ්‍යවේදී අනුමාන කිරීම් ආදේශ කිරීම යි. 1939-40 සුලු ධනේශ්වර විරුද්ධ පක්ෂයට එරෙහි අරගලය සමහන් කල නො හැකි වීමේ අර්ථයෙන් ම සමාජවාදී කම්කරු පක්ෂය තුල අරගලයත් සමහන් කල නො හැකි එකක් බවට පත් කර ඇත්තේ මෙම කරුන යි.

අරගලයේ මාවතේ දී කොක්රාන්වාදය පහත දැක්වෙන අංග ලක්ෂන ප්‍රකට කර ඇත:

1. පක්ෂ සම්ප්‍රදාය කෙරෙහි හා පක්ෂයේ ඓතිහාසික කර්තව්‍යය කෙරෙහි නිගරුව. ඇමරිකානු ට්‍රොට්ස්කිවාදයේ 25 වසරක සම්ප්‍රදාය හෙලාදැකීමට, හාස්‍යයට බඳුන් කිරීමට අවඥාවට පාත්‍ර කිරීමට ලැබෙන අවස්ථාවක් කොක්රාන්වාදීන් විසින් අතපසු කරනු ලැබුනොත් ඒ අසිරුවෙනි.

2. මූල ධර්මවත් මාක්ස්වාදී දේශපාලනය, "පක්ෂ පරිපාලනයට" එරෙහි මූල ධර්ම විරෝධී කට්ටි ගැසීම්වලින් විස්ථාපනය කිරීමේ ප්‍රවනතාවක්. මේ අනුව කොක්රාන්වාදී ප්‍රවනතාව පරස්පර විරෝධී පුද්ගලයන්ගේ පෙරමුනකින් සමන්විත වෙයි. ප්‍රධාන වසයෙන් නිව්යෝක් නගරය වටා කේන්ද්‍ර ගත වුනු එක් කන්ඩායමක් ඇමරිකානු ස්ටැලින්වාදී ව්‍යාපාරයට "ඇතුල් වීමේ" උපායකට හිතපක්ෂපාතී වෙයි.

ප්‍රධාන වසයෙන් ඩිට්‍රොයිට් නගරය මධ්‍යස්ථානය කර ගත්, ගතානුගතික වෘත්තිය සංගමික කොටස්වලින් සමන්විත වන තවත් කන්ඩායමක් ස්ටැලින්වාදීන් වෙත යොමු වීමෙන් අත්පත් කර ගත හැකි වාසි සුලු යැයි සිතත්. එය තමන්ගේ සංශෝධනවාදී දෘෂ්ටිය පදනම් කර ගනුයේ නව කම්කරු නිලධරයෙහි ස්ථාවරත්වය හා කල් පවත්නා බලය පිලිබඳ ව අධිතක්සේරුවක් මත ය.

කොක්රාන්වාදයට ආකර්ෂනය වූ පුද්ගලයන් අතර

වෙහෙසට පත් වූවෝ ද වෙත්. ඔවුන් හට තව දුරටත් වර්තමාන දුෂ්කර කොන්දේසිවලින් එල්ල කෙරෙන පීඩනයන් දරා සිටිය නො හැකි ය. එහෙයින් ඔව්හු නිෂ්ක්‍රිය භාවයට පසුබසිනු වස් පිළිගත හැකි යුක්ති සහගත කිරීමක් සොයා යත්.

මූල ධර්මාත්මක නො වන මෙම පෙරමුන එක් කොට බඳින සිමෙන්තිය වනුයේ සම්මත ට්‍රොට්ස්කි වාදයට පවත්නා පොදු ද්වේෂ සහගත විරෝධය යි.

3. ඇමරිකාව තුළ අපගේ ප්‍රධාන මල්ලව භූමිය විය යුතු මහා නිෂ්පාදන කර්මාන්තවල දේශපාලනික වසයෙන් අප්‍රබුද්ධ කම්කරුවන් කෙරෙන් පක්ෂය බැහැරට යොමු කරවීමේ ප්‍රවනතාවක්.

තත්‍ය වසයෙන් ගත් කල්හි කොක්රාන්වාදීහු සමාජවාදී කම්කරු පක්ෂය විසින් මෙම කම්කරුවන් වෙත යාමට සේතුවක් හැටියට උපයෝග කර ගත් සංක්‍රමනික සටන් පාඨ හා ක්‍රියා මාර්ගය අත්හැර දැමූහ. එසේ කරමින් ඔව්හු මෙම මාවත ගත් බහුතරය කම්කරුවන්ගේ පසුගාමීත්වයට අනුගත වන්නේ වෙති යි තර්ක කලහ.

4. තෙවන ලෝක යුද්ධයට පෙර ඇමරිකානු කම්කරු පන්තිය ඇමරිකානු අධිරාජ්‍යවාදයට එරෙහි ව පෙරලි කාරී විරෝධයකින් පෙරට එමට ඇති හැකියාව පිළිබඳ ඒත්තු ගැනීම බැහැර කිරීම.

ස්ටැලින්වාදයට "තව දුරටත් පාවා දිය නො හැකි ය", ස්ටැලින් වාදීන්ට එක්සත් ජනපදය තුළ විප්ලවයකට නායකත්වය ලබා දීමට පුලුවන් කරවන විප්ලවීය පාර්ශ්වයක් ස්ටැලින්වාදයට ඇත; ස්ටැලින්වාදීන් විප්ලවයට නායකත්වය දීමේ මාවතෙහි දී ට්‍රොට්ස්කිගේ "අදහස්" අවශෝෂනය කර ගනු ඇත; ඒ අනුව යථා කාලයෙහි විප්ලවය "තමන් නිරවද්‍ය භාවයට පත් වනු ඇත:" මෙබඳු අධිකතර විශ්වාසයකට සිඳී යන විධියේ ග්‍රාම්‍ය අත්හදා බැලීම් සහගත න්‍යාය කරනයක් "වාම" ස්ටැලින්වාදය සමග පවත්වා ගෙන යාම.

6. අලුත් සිදුවීම් හමුවෙහි ස්ටැලින්වාදයට අනුගත වීම. බෙරියාගේ කඩා වැටීම හා ඉන් අනතුරුව සෝවියට් සංගමයෙහි සිදු කෙරුනු ඉමහත් විරේක කිරීම් පිළිබඳ ව පැබ්ලෝගේ නිර්වචනයෙහි දිස් වන ස්ටැලින්වාදය හා සමහන් වීම ඔව්හු ආරක්ෂා කරත්; ඊට පිටුබලය සපයත්. නැගෙනහිර ජර්මානු කම්කරුවන්ගේ දැවැන්ත නැගිටීම හා ප්‍රන්ස මහා වැඩ වර්ජනය සම්බන්ධයෙන් ස්ටැලින්වාදීන්ගේ ප්‍රතිවිප්ලවීය කාර්ය භාරය ආවරනය කරන පැබ්ලෝගේ තර්ක විතර්ක ඔව්හු පුනරුච්චාරනය කරත්. ඩෙමොක්‍රටික් පක්ෂය දිශාවට ඇමරිකානු ස්ටැලින්වාදයේ හැරීම වාම හැරීමක් තුළ වූ හුදු "දක්ෂිනාංශික දෙගිඩියාවක්" හැටියට පවා ඔව්හු නිර්වචනය කරත්.

7. සංවිධානය පිළිබඳ ප්‍රශ්නවල දී ලෙනින්වාදයේ සම්ප්‍රදායන් කෙරෙහි වන අවඥාව. කලක් ඔව්හු පක්ෂය තුළ "ද්වන්ද්ව බලය" තහවුරු කිරීමට යත්න දැරූහ. පක්ෂයේ වැඩි මනත් බහුතරය විසින් 1953 මැයි සැසි වාරයෙහි දී ඔවුන් මැඩ පවත්වනු ලැබුනු කල්හි බහුතරයේ නියමය පරිදි ක්‍රියා කිරීමට හා සැසිවාරය විසින් තීන්දු කෙරුනු ආකාරයට දේශපාලනික මාවත ගැනීමට ඔව්හු ලිඛිත එකගතාවක් පල කලහ. අනතුරුව ඔව්හු එම එකගතාව බිඳ හෙලූහ; පක්ෂ කටයුතුවල දී කන්ඩායම්වාදී කඩාකප්පල් කිරීම වඩාත් උත්සන්න හා වලිප්පු සහගත මට්ටමකින් කර ගෙන යාම යලි ආරම්භ කලහ.

කොක්රාන්වාදයේ ප්‍රධාන අංග ලක්ෂන අපි ඉහත ගෙන හැර දැක්වීමු. පක්ෂය තුළ කොක්රාන්වාදය කිසි ම දාක දුර්වල සුලුතරයකට වැඩි යමක් නො වී ය. පක්ෂ නායකත්වයට පිටුපසින් පැබ්ලෝගෙන් ලද ආධාරය හා උනන්දු කිරීම නිසා නො වේ නම් කිසි ම දාක අශුභවාදයේ අතිශයින් ම දුර්වල හා රෝගී ප්‍රකාශනයට වැඩි යමක් නො වනු ඇත.

පැබ්ලෝගේ රහසි ගත උනන්දු කිරීම් හා පිටුබලය සැපයීම් අපගේ මැයි සැසි වාරය අවසන් වූ ටික දිනකින් ම එලිදරව් කරනු ලැබුනි. එතැන් පටන් පැබ්ලෝ අපගේ පක්ෂයේ සංශෝධනවාදී කන්ඩායමත් සමග විවෘත සහයෝගීත්වයකින් ක්‍රියා කරයි. පක්ෂ අරමුදල් කඩාකප්පල් කිරීම, පක්ෂ කටයුතු අඩාල කිරීම හා භේදයකට සූදානම් වීම උදෙසා මෙම කන්ඩායම ගෙන යන උද්ඝෝෂනයට පැබ්ලෝ ආවේශය ලබා දෙයි.

පැබ්ලෝ-කොක්රාන් කන්ඩායම මෙම ද්‍රෝහී පිලිවෙත, නිව් යෝර්ක් නුවර පැවැත්වුනු පක්ෂයේ 25 වන සංවත්සරෝත්සවය සංවිධාන ගත ව වර්ජනය කිරීමෙන් කූලුගැන්වූහ; නිව් යෝර්ක් නගර සභා මැතිවරන උද්ඝෝෂනයේ අවසන් රැලියක් හා මෙම සංවත්සරෝත්සවය ආබද්ධ විය.

මෙම ද්‍රෝහී, වර්ජන බිඳීමේ ක්‍රියාකාරිත්වය යථා වසයෙන් සමන්විත වූයේ ඇමරිකානු ට්‍රොට්ස්කිවාදයේ 25 වසරක අරගලයට විරුද්ධ සංවිධානාත්මක ප්‍රකාශනයකිනි. ඒ හා සමග ම එය 1928 ඔක්තෝබරයේ දී ඇමරිකානු ට්‍රොට්ස්කිවාදයේ ආරම්භක න්‍යෂ්ටිය පිටුවහල් කලා වූ ස්ටැලින්වාදීන්ට සපයන ලද වෛෂයික ආධාරයක් ද විය.

මෙම රැස්වීම සංවිධානාත්මකව වර්ජනය කිරීම යථාර්ථ වසයෙන් ගත් කල්හි නිව් යෝක් නගර සභා නිලවරනය පිළිබඳ සමාජවාදී කම්කරු පක්ෂ උද්ඝෝෂනයට විරුද්ධ ව එල්ල කෙරුනු ප්‍රකාශනයක් විය.

මෙම ද්‍රෝහී පක්ෂ විරෝධී ක්‍රියාවට සහභාගි වූ සියල්ලන් ම විසින් තමන් දිගු කාලීන ව සූදානම් කෙරුනු භේදය පරිසමාප්තියට පත් කෙරුනු අතර පක්ෂ සාමාජිකත්වයට ඇති සියලු ම අයිතිවාසිකම් ද අත්හැර දමනු ලැබින.

නිල වසයෙන් මෙම කරුන වාර්තා ගත කරමින්, සමාජවාදී කම්කරු පක්ෂයේ 25 වන වාර්ෂික සැසිවාරය, වර්ජනය සංවිධාන කලා වූ ජාතික කමිටු සාමාජිකයන්ගේ සාමාජිකත්වය තහනම් කලේ ය. එසේ ම මෙම ද්‍රෝහී, වර්ජන බිඳීමේ ක්‍රියාවට සහභාගි වූ සියල්ලන් හා ඊට තමන්ගේ අනුමැතියක් නැති බව ප්‍රකාශ කිරීම ප්‍රතික්ෂේප කලවුන් ඒ හේතුවෙන් තමන් සමාජවාදී කම්කරු පක්ෂ සේනාංක

කෙරෙන් පරිබාහිර වන බව ද ප්‍රකාශයට පත් කලේ ය.

## ස්ටැලින්වාදී ජාත්‍යන්තරයේ විධි ක්‍රම

සංශෝධනවාදී කොක්රාන් ප්‍රවනතාව සමග රහසි ගත ව සම්බන්ධතා පවත්වන අතරවාරයෙහි සමාජවාදී කම්කරු පක්ෂ නායකත්වයට තවත් මුහුනක් පෙන්වීමේ පැබ්ලෝගේ වංචනිකත්වය ට්‍රොට්ස්කිවාදයේ සම්ප්‍රදායන්ට පිටස්තර වූ විධි ක්‍රමයක් වන්නේ ය. එහෙත් එය අයත් වන සම්ප්‍රදායක් ද පවතී. එනම්, ස්ටැලින්වාදය යි. ක්‍රෙම්ලිනය විසින් උපයෝග කර ගනු ලැබුනු එබඳු උපක්‍රම කොමියුනිස්ට් ජාත්‍යන්තරය දූෂනය කිරීමෙහි ලා හේතුකාරක විය.

මේ පිලිබඳ ව අප බොහෝ දෙනෙකුට 1923-28 කාල පරිච්ඡේදයෙහි ලද පුද්ගලික අත්දැකීම් ඇත.

ක්‍රියාත්මක වීමේ මෙම විධිය පැබ්ලෝගේ පැත්තෙන් ඇති වූ හුදකලා අපසරනයක් නො වේ ය යන්නට දැන් ඇති සාක්ෂි තීරනාත්මක ය. මෙහි දී නො වෙනස් වන මෝස්තරයක් දිගින්දිගට ම දිස් වෙයි.

නිදර්ශන වසයෙන්, හතර වන ජාත්‍යන්තරයේ නායක යුරෝපීය ශාඛාවන්ගෙන් එකක ප්‍රමුඛ පක්ෂ නායකයෙකුට පැබ්ලෝගෙන් මෙබඳු නියෝගයක් ලැබුනි: "හතර වන ලෝක සම්මේලනය වන තුරු බහුතරයේ පිලිවෙතත් ජාත්‍යන්තරයේ විනයත් ආරක්ෂා කරන්නකු ලෙස පැවතිය යුතු ය." නියෝගයත් සමග ම පැබ්ලෝ යම් හෙයකින් තම නියෝගයට අකීකරු වුව හොත් එහි ඵල විපාක භුක්ති විඳින්නට සිදු වනු ඇති බවටත් තර්ජනය කලේ ය.

පැබ්ලෝ මෙහි දී උපයෝග කර ගන්නා බහුතරය යන වචනය, ඔහු සරල ව ම තමන් ද තමන්ගේ සංශෝධනවාදී නවීකරනයන්ගෙන් මෝහනය වුනු කුඩා සුලුතරය ද හැඳින්වීමට යොදන නිරහංකාර ලේබලය වෙයි. පැබ්ලෝගේ අලුත් පිලිවෙත ට්‍රොට්ස්කිවාදයේ මූලික ක්‍රියා මාර්ගය හා ප්‍රචන්ඩ ලෙස ගැටේ. ලෝක ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ බොහෝ කොටස් තුල එය සාකච්ජා වීමට පටන් ගැනුනා පමනි. එය එක ද ට්‍රොට්ස්කිවාදී සංවිධානයක පිටුබලය නො ලබන හෙයින් හතර වන ජාත්‍යන්තරයේ සම්මත නිල පිලිවෙතින් සමන්විත නො වේ. සාකච්ජාවක් කරන තුරු හෝ ඡන්දයක් පවත්වන තුරු නතර නො වී, ලෝක පරිමාන සංවිධානය මත තමන්ගේ සංශෝධනවාදී අදහස් උදහස් පැටවීමට දරන උද්ධච්ච උත්සාහය කෙරෙහි උද්ගත වන්නා වූ කෝපය අපට ලැබුනු පලමු වාර්තාවන්ගේ ඇගවුම් කෙරේ. හතර වන ජාත්‍යන්තරය වැඩිමනත් බහුතරයකින් පැබ්ලෝගේ පිලිවෙත ප්‍රතික්ෂේප කිරීම ඒකාන්ත යැයි පැවසීමට සෑහෙන තොරතුරු දැනට මත් අප සතු ව පවතියි.

පැබ්ලෝගේ සංශෝධනවාදී දේශපාලනික පිලිවෙත විවේචනය කිරීමෙන් වලකින හැටියට, හතර වන ජාත්‍යන්තරයේ කොටසක නායකයෙකුට පැබ්ලෝ කල ඒකාධිපති අනාඥාව ඇති තරම් දුෂ්ට ය. එහෙත් පැබ්ලෝ එතැනින් නතර නො වී ය. මෙම නායකයාට මුකවාඩම් බැඳ, ඔහුගේ අත්දැකීම්වලින් දැනීමෙන් හා අන්තර්-ඥානයෙන් පක්ෂ නායකත්වයට හා අනුගාමිකත්වයට ඵල ප්‍රයෝජන ලැබිය හැකි වන විධියේ නිදහස් සාකච්ජාවකට සහභාගි වීමෙන් ඔහු වලක්වා ලීමට යත්න දරන අතරවාරයෙහි පැබ්ලෝ සංවිධානාත්මක වසයෙන් ක්‍රියා කිරීමටත් පෙරට ගියේ ය. ඔහුගේ උත්සාහය වූයේ මෙම කොටසෙහි නායකත්වයට විරුද්ධ ව යුද්ධ ප්‍රකාශ කරනු පිනිස සුලුතර සංශෝධනවාදී කන්ඩායමක් කැටි කර ගැනීම ය.

මෙම වැඩ පිලිවෙල උද්ගත වූයේ, ස්ටැලින්වාදයේ බලපෑම යටතේ පරිහානි ගත වූ කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ ජුගුප්සජනක සම්ප්‍රදායෙනි. මීට වැඩි හේතුවක් නො තිබුනත්, හතර වන ජාත්‍යන්තරය අභ්‍යන්තරික කුනු වීමෙන් ආරක්ෂා කරනු පිනිස, පැබ්ලෝවාදය හා අවසානයක් දක්වා සටන් කිරීම අවශ්‍ය වන්නේ ය. මෙබඳු උපායන්ට පැහැදිලි අරමුනක් ඇත. මේවා පැබ්ලෝවාදී සුලුතරය සූදානම් කරන කුමන්ත්‍රනයක කොටසක් වෙයි. පැබ්ලෝගේ පරිපාලනමය බලතල උපයෝග කර ගෙන ඔහුගේ සංශෝධන වාදී පිලිවෙත හතර වන ජාත්‍යන්තරය මත පැටවීමට ඔව්හු අපේක්ෂා කරත්. ඊට එරෙහි ව ඇති වන ප්‍රතිරෝධයට භේද වීම් හා පලවා හැරීම්වලින් පිලිතුරු දීම ඔවුන්ගේ අදහස යි.

දැන් හොඳින් ම පැහැදිලි ව තිබෙන පරිදි මෙම ස්ටැලින්වාදී සංවිධානාත්මක ක්‍රියා කලාපය ආරම්භ වූයේ මීට වසර එක හමාරකටත් වඩා පූර්වයෙන් හතර වන ජාත්‍යන්තරයේ ප්‍රන්ස ශාඛාවෙහි බහුතරයට එරෙහි ව පැබ්ලෝගේ විනාශකාරී උද්ඝෝෂනයෙහි දී ඔහු විසින් තම පරිපාලන බල තල තිරශ්චීන අයුරින් අපචාරයෙහි යෙදීමත් සමග ය.

ජාත්‍යන්තර ලේකම් මන්ඩලයේ නියෝගයෙන්, ප්‍රන්ස ශාඛාවෙහි තේරී පත් වුනු බහුතරය පක්ෂයේ දේශපාලනික කටයුතු කිරීමට එයට පවත්නා අයිතීන් ක්‍රියාත්මක කිරීමෙන් වලක්වනු ලැබුනි. ඒ වෙනුවට දේශපාලනික මන්ඩලය හා මුද්‍රනාලය "පක්ෂ කොමිසමක" පරිපාලනය යටතට පත් කෙරින.

බහුතරයක් පෙරලා දමනු පිනිස, සුලුතරයක් උපයෝග කර ගැනුමේ මෙම හිතුවක්කාර ක්‍රියා කලාපය, එම අවස්ථාවෙහි දී අපි ගැඹුරින් ම හෙලා දුටුවෙමු. මේ ගැන අසන්නට ලැබුනු වහා ම වඩාත් බලගතු ක්‍රියා මාර්ගයක් නො ගැනීමේ වරද අපි පිලිගනිමු. මෙම වරදට හේතු වූයේ සැබෑ කරුනු පිලිබඳ ව ප්‍රමානවත් අවබෝධයක් අප තුල නො වීම යි. පැබ්ලෝ හා ප්‍රන්ස ශාඛාව අතර පැවති මතභේද උපාය සම්බන්ධිත ඒවා යැයි අපි සිතුවෙමු. එහෙයින් අපි පැබ්ලෝගේ සංවිධානාත්මක පිලිවෙත් ගැන අපගේ සැකසංකා තිබිය දී ම පැබ්ලෝගේ පක්ෂය ගත්තෙමු. මාස ගනනක් තිස්සේ පැවතුනු විනාශකාරී කන්ඩායම්ක අරගලයෙන් අනතුරුව බහුතරය පලවා හරිනු ලැබුනි.

පතුලෙන් ම ගත් කල්හි මත භේද ඒවායේ ස්වභාවයෙන් ක්‍රියා මාර්ගික විය. සත්‍යය නම් බහුතරයේ ප්‍රන්ස සහෝදරවරුන් අපට වඩා පැහැදිලි ව, සිදු වෙමින් පැවති දේ දැකීම යි. "අනාගතයට, හතර වන ජාත්‍යන්තරයේ පැවැත්මට ම පවා බරපතල විනාශයක අනතුර බලපවත්වන බව" ඔවුන්ගේ පක්ෂයේ අට වන සම්මේලනය විසින් ප්‍රකාශයට පත් කෙරින. එම සම්මේලනයෙන් තව දුරටත්

මෙසේ ද කියැවිනි: “බියගුලු බවින් ද සුලු ධනේශ්වර ධාරනාවාදයෙන් ද නිපන් සංශෝධනවාදී සංකල්ප එහි නායකත්වය තුල දෘෂ්‍යමාන වෙයි. කන්ඩායම්වල ජීවිතයෙන් කැඩී වෙන් වූ ජාත්‍යන්තරයේ වඩාත් බරපතල දුර්වලතා පුද්ගලික පරිපාලනයක් පිලිබඳ පද්ධතිය ස්ථාපිත වීමට ක්ෂනික ව බල පා තිබේ. මෙම පුද්ගලික පරිපාලනයත් එහි ප්‍රජාතන්ත්‍ර විරෝධී විධි ක්‍රමත් පාදක වී ඇත්තේ ට්‍රොට්ස්කිවාදී ක්‍රියා මාර්ගය සංශෝධනය කිරීමත් මාක්ස්වාදී විධි ක්‍රමය අත්හැර දැමීමත් මත ය.” (ලා වෙරිටේ, සැප්තැම්බර් 18, 1952)

මුලු මහත් ප්‍රන්ස තත්වය ම, අනතුරුව ඇති වූ වර්ධනයන්හි ආලෝකයෙන් පිරික්සිය යුතු ය. මෑත දී පැවති මහා වැඩ වර්ජනයෙහි දී ප්‍රන්ස ශාඛාවෙහි බහුතරය ඉෂ්ට කල කාර්ය භාරය ඉතාමත් ම තීරනාත්මක ආකාරයෙන් ප්‍රකට කරනුයේ ඔවුන් සම්මත ට්‍රොට්ස්කිවාදයේ මූල ධර්ම ඔසවා තැබිය යුත්තේ කෙසේ දැයි යන්න දන්නා බව යි. හතර වන ජාත්‍යන්තරයේ ප්‍රන්ස ශාඛාව අයුක්ති සහගත අයුරින් නෙරපා හරිනු ලැබුනි. ලා වෙරිටේ පුවත්පත වටා කන්ඩායම් ගත වුනු ප්‍රන්ස බහුතරය, ප්‍රන්සයේ සැබෑ ට්‍රොට්ස්කිවාදීන් වන අතරෙහි සමාජවාදී කම්කරු පක්ෂය විසින් විවෘත ලෙසින් ඒ අයුරින් පිලිගනු ලැබේ.

පැබ්ලෝ හතර වන ජාත්‍යන්තරයෙහි චීන ශාඛාවේ දේශපාලනික - ආස්ථානය මඩ ගැසීම් ද සහිත ව ඉදිරිපත් කරන අයුරු වෙසෙසින් ම පිලිකුල දනවයි. පැබ්ලෝ කන්ඩායම විසින් ඔවුන් “කට්ටිවාදීන්” ලෙස “විප්ලවයෙන් පලා යන සරනාගතයන්” ලෙස චිත්‍රනය කෙරී ඇත.

පැබ්ලෝ කන්ඩායම විසින් හිතාමතා නිර්මානය කෙරුනු ධාරනාවට පටහැනි ව, චීන ට්‍රොට්ස්කිවාදීන් ක්‍රියා කලේ, චීන කම්කරු පන්තියේ නිර්ව්‍යාජ විප්ලවීය නියෝජිතයන් ලෙස ය. ඝාතනය කරනු පිනිස 1918 විප්ලවයෙහි ලක්සම්බර්ග් ලා හා ලිබ්නෙක්ට් ලා තෝරා බේරා ගත් ජර්මනියෙහි නොස්කේවරුන් හා ෂීඩ්මාන්වරුන් අනුව යමින්, ස්ටැලින්, සෝවියට් සමාජවාදී සමුහාන්ඩු සංගමය තුල, ලෙනින්ගේ බොල්ෂෙවික්වරුන් මුලු මහත් පරම්පරාව ම ඝාතනය කරනු පිනිස තෝරා බේරා ගත් පරිද්දෙනි, මාඕ පාලන තන්ත්‍රය චීන ට්‍රොට්ස්කිවාදීන් ඔවුන්ගේ කිසිදු වරදකින් තොර ව ම තම ගොදුරු ලෙස වෙන් කර ගත්තේ. එහෙත් ස්ටැලින්වාදය කෙරෙහි පැබ්ලෝගේ සහනශීලි පිලිවෙත නො ඉවසිලි සහගත අයුරින් ඔහු යොමු කරවනුයේ අප චීන සහෝදරවරුන්ගේ ස්ථිරසාර මූල ධර්මාත්මක ආස්ථානය මත අඳුරු පැහැ තවරන අතරවාරයේ මාඕ ආන්ඩුව රෝස පැහැ ගැන්වීමට ය.

**කල යුතු දෙය**

හකුලුවා දක්වතොත්: පැබ්ලෝගේ සංශෝධනවාදය හා සාම්ප්‍රදායික ට්‍රොට්ස්කිවාදය අතරෙහි බෙදුම් කඩන කෙතරම් ගැඹුරු දැයි කිව හොත්, දේශපාලනික ව සංවිධානාත්මක ව හෝ කිසිදු සම්මුතියක් ඇති කර ගැනුමට පුලුවන්කමක් නැත. සැබවින් ම බහුතර මතය පිලිබිඹු කරන ප්‍රජාතාන්ත්‍රික තීන්දුවලට එලඹීමට අවසර නො දෙන බව පැබ්ලෝ කන්ඩායම පෙන්නුම් කර ඇත. ඔවුන්ගේ සාපරාධී පිලිවෙතට පූර්න යටත් වීමක් ඔව්හු ඉල්ලා සිටිත්. සියලු ම සම්ප්‍රදායික සම්මත ට්‍රොට්ස්කිවාදීන් හතර වන ජාත්‍යන්තරයෙන් එලවා දැමීමට හෝ ඔවුන්ට මුකවාඩම් බැඳීමට හා මාංචු දැමීමට ඔව්හු අදිටන් කර ගෙන සිටිත්.

ඔවුන්ගේ උපක්‍රමය වූයේ, තමන් තුල ස්ටැලින්වාදය කෙරෙහි වූ මිත්‍රශීලීත්වය ටිකෙන් ටික එන්නත් කිරීම හා එසේ ම සිදු වන දෙය දැක එයට විරෝධය පාන්නට පැමිනෙන්නන්ගෙන් ටිකෙන් ටික නිදහස් වී ගැනීම ය. පැබ්ලෝවාදී ක්‍රියා හා උපායික මග හැරීම් බොහොමයක අපූරු දෙබිඩි ලක්ෂනය පැහැදිලි කල හැකි වනුයේ එපරිද්දෙනි.

පැබ්ලෝ කල්ලිය මෙම මූල ධර්ම විරහිත හා මැකියවෙලියානු උපාමාරු දැමීම්වලින් මේ දක්වා කිසියම් සාර්ථකත්වයක් අත්පත් කර ගෙන ඇත. එහෙත් වෙනස් වීමේ ගුනාත්මක ලක්ෂය එලඹ තිබේ. දේශපාලනික ප්‍රශ්න උපාමාරු පුපුරුවා ගෙන ඉස්මතු වී ඇති අතර, මෙතැන් පටන් සටන එලිමහනෙහි කෙරෙනු ඇත.

හතර වන ජාත්‍යන්තරයේ අනුගාමිකත්වයෙන් බැහැර ව සිටීමට අපට බල කෙරී ඇති තත්වයක, එවන් බාහිර ආස්ථානයක සිටිමින් හතර වන ජාත්‍යන්තරයේ ශාඛාවලට උපදෙසක් දීමට අපට හැකි නම්, ක්‍රියා කිරීමට, තීරනාත්මක ව ක්‍රියා කිරීමට, කාලය එලඹ ඇතැයි අප සිතන බව අපි පවසමු. පැබ්ලෝ විසින් අධිකාරය පැහැර ගනු ලැබීමට විරුද්ධ ව, හතර වන ජාත්‍යන්තරයේ සම්ප්‍රදායික ට්‍රොට්ස්කිවාදී බහුතරයට තමන්ගේ අධිෂ්ඨානය තහවුරු කිරීමට කාලය එලඹ තිබේ.

ඊට අතිරේක ව ඔවුන් පැබ්ලෝ හා ඔහුගේ ඒජන්තයන් තනතුරුවලින් ඉවත් කල යුතු ය; සම්මත ට්‍රොට්ස්කිවාදය ඔසවා තබමින්, දේශපාලනික හා සංවිධානාත්මක වසයෙන් නිරවද්‍ය මාවතක ව්‍යාපාරය තබා ගැනුමට තමන් දන්නා බව භාවිතයෙහි දී ඔප්පු කල කේඩර මගින් එම තනතුරු පුරවාලිය යුතු ය.

සහෝදරාත්මක ට්‍රොට්ස්කිවාදී සුබ පැතුම් සමග,

සමාජවාදී කම්කරු පක්ෂයේ ජාතික කමිටුව.

© ලෝක සමාජවාදී වෙබ් අඩවිය